# බළන්ගොඩ නගර සභාව

## 2020-11-10 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

දිනය - 2020.11.10

වේලාව - පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.

සහභාගීත්වය

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ටී. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

නිළධාරී සහභාගීත්වය

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ජී.කරුණාරත්න මිය |

01. පසුගිය මහ සභාවේ සභා වාර්තාව හා විශේෂ මහ සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2020-10-15 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2020-10-27 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙය පවසා සිටින ලදී.

එහිදී ගරු උප සභාපති එම්.වී.එම්.රූමි මැතිතුමා විසින් 2020-10-15 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2020-10-27 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින මහ සභාවේ සංශෝධනයන් ලෙස ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් 2020-10-27 දින විශේෂ මහ සභා වාර්තාවේ හරක් මස් කඩ කාමරය ටෙන්ඩර් කිරීමේ ගාස්තුව " මාසිකව" යන්න සටහන් කරන ලෙස පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් ඇස්තමේන්තු අනුමත කිරීම යටතේ (09.02.01 යටතේ) "අනඳමෙත්ගම ප්‍රජා ශාලාව" යන කොටස "අනඳමෙත්ගම සේවා පියස" ලෙස වෙනස්විය යුතු බවත්, 29 පිටුවේ 07.04 යෝජනාවේ "එම්.ඩබ්.විමලසිරි මැතිතුමා" යනුවෙන් සටහන්ව ඇති ස්ථාන දෙක "ජී.චන්ද්‍රලතා මැතිතුමිය" ලෙස වෙනස් විය යුතු බව පවසන ලදී.

ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තා සභා සම්මත විය.

02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන

- තමා සභාපතිත්වය දරණ අවසන් සභාවට පෙර සභාව මෙය විය හැකි බැවින් සියලු දෙනා තම ජංගම දුරකථන ක්‍රියාවිරහිත කරගනිමින් සභාවේ කටයුතු කරගෙන යාම සඳහා සහයෝගය ලබා දෙන ලෙස පවසන ලදී.

03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම

- බළන්ගොඩ කොටුගොඩැල්ල මාර්ගය කාපට් කිරීමට සැලසුම් කර ඇති නමුත් ඊට පෙර උස්ගල් හේවා මහතාගේ නිවස ඉදිරිපිට අඩි 100 පමණ හා ධනපාල මහතාගේ නිවස අසළ අඩි 75 ක් පමණ හා ඒ.සී.එල්. නිවය ඉදිරිපිට ඉහළින් ගලා එන ජලය කාණු පද්ධතියට සම්බන්ධ කර, බෝධිය අසළ මාර්ගයේ ප්‍රධාන ජල නලය මගින් ජලය මාර්ගයට ගලා එන බැවින් එය සකස් නොකර කාපට් කිරීමෙන් එම මුදල් අපතේ යන බැවින් මේ පිළිබඳව අධීක්ෂණය කර නිසි ක්‍රියා මාර්ග ගන්නා ලෙස අංක 19 කොටුගොඩැල්ල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ධනපාල වඩුමේස්ත්‍රීගේ මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

- නො.20, වෙට්නොල් පාර, එපිටපැත්ත, බළන්ගොඩ ලිපිනයේ පදිංචි ඊ. සුනිල් ශාන්ත මහතා විසින් එපිටපැත්ත ප්‍රධාන මාර්ගයේ අතුරු මාර්ගයක් වන ඉහත සඳහන් මාර්ගය කොන්ක්‍රීට් කර හෝ කොන්ක්‍රීට් ගල් අතුරා සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- නො.415/7, ඕලුගංතොට, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි කේ.එම්.උදය සංජීව යන අය විසින් තම නිවසට යාබද නිවසේ පදිංචි පී.ඩී.ඩිංගිරි මහත්මයා යන අයගේ ඉඩමේ මායිමේ තම නිවසට හානිදායකව ඇති බෙලි ගස කපා ඉවත් කර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- අංක 79/ඒ, ශ්‍රී සුදර්ශනගම, තුඹගොඩ බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි අමිල සඳරුවන් සිල්වා යන අය විසින් තම ඉඩම, අංක 79 ඉඩම, අංක 78 ඉඩම, 79/ඒ ඉඩම, හා 89/ඒ ඉඩම් හරහා සුදර්ශනගම රංවල මහතාගේ නිවස ඉදිරියෙන් ගලා එන බෝක්කුවේ ජලය මෙම ඉඩම් හරහා ප්‍රධාන පාරේ බෝක්කුවට ගලා යන බැවින් මේ සඳහා අවශ්‍ය බෝක්කු දමා සංවර්ධනය කරන ලෙස පවසන ලදී.
- අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ මාර්ග කිලෝමීටර් ලක්ෂයක් කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ මේ දිනවල කිරිදිගල ශෛලතලාරාම මාර්ගය, කිරිදිගල බලවත්ත කමාර්ගය, කිරිදිගල රබර්වත්ත මාර්ගය සංවර්ධනය වෙමින් පවතින අතර එහිදී මාර්ග පුළුල් කිරීමේදී විදුලි කණු හා දුරකතන කණු නිසා අවහිර වී ඇති බැවින් එම කණු ඉවත්කිරීම සඳහා අදාළ ආයතන වෙත දැනුම්දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.

04.01 2021 වර්ෂය සඳහා සභාව සතු වාහන රක්ෂණය කිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් විවෘත කිරීම.

2021 වර්ෂය සඳහා සභාව සතු වාහන රක්ෂණය කිරීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් අනුව ආයතන 04 කින් මිල ගණන් ලැබී තිබුනි. 2021 වර්ෂයට අදාලව පහතින් දක්වා ඇති වාහන 38 රක්ෂණය කිරීම සඳහා අවම මිලක් ඉදිරිපත් කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදලින් ඉදිරිපත් කර ඇති රුපියල් 234,676.16 ක මිල ගණන යටතේ එයින් ඉදිරිපත් කර ඇති හදිසි අනතුරු, ගිනි බාහිර පිපිරීම්, විදුලි කෙටීම් ස්වයං දහනය, ගංවතුර, ස්වාභාවික විපත්, තුන්වන පාර්ශව වගකීම්, මරණ, පුද්ගල හදිසි අනතුරු කම්කරු ආවරණ- රියදුරු සඳහා වැඩවර්ජන, කැරලි කෝලාහල ආවරණ යන ආවරණ හිමිකම් සහිතව පහත වාහන 2021 වර්ෂය සඳහා රක්ෂණය කිරීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

| අනු අංකය | වාහන අංකය | මිල ගණන රු. |
|---|---|---|
| 01 | VI 1833 | 5,176.40 |
| 02. | JD 4684 | 2,691.71 |
| 03. | UQ 1933 | 3,367.40 |

| | | |
|---|---|---|
| 04. | RB 4786 | 5,130.48 |
| 05. | RC 8183 | 4,518.10 |
| 06. | RC 1107 | 5,387.50 |
| 07. | RC 1118 | 4,518.10 |
| 08. | HF 8558 | 3,866.05 |
| 09. | HF 8952 | 3,866.05 |
| 10. | GK 6227 | 4,518.10 |
| 11. | RD 8000 | 8,321.73 |
| 12. | RE 2600 | 7,787.70 |
| 13. | RD 8240 | 8,321.73 |
| 14. | GK 1483 | 4,518.10 |
| 15. | 37-7933 | 2,779.30 |
| 16. | RV 8543 | 2,060.82 |
| 17. | RW 1639 | 2,488.50 |
| 18. | 44-7142 | 909.00 |
| 19. | RW 5784 | 1,786.50 |
| 20 | RW 1962 | 2,488.50 |
| 21. | 67-1565 | 803.70 |
| 22. | 46-3164 | 1,084.50 |
| 23. | 46-4907 | 1,014.30 |
| 24. | HI 2234 | 909.00 |
| 25. | HI 2269 | 909.00 |
| 26. | RX 2069 | 2,664.00 |
| 27. | RX 2332 | 2,664.00 |
| 28. | RX 4400 | 11,549.70 |
| 29. | 67-3301 | 1,581.30 |
| 30. | LL 2110 | 22,168.00 |
| 31. | LL 7688 | 14,698.50 |
| 32. | 56-1906 | 7,126.70 |
| 33. | ND 5124 | 35,759.12 |
| 34. | 226-7521 | 6,474.25 |

| | | |
|---|---|---|
| 35. | 227-5020 | 10,821.25 |
| 36. | QL 2901 | 2,367.90 |
| 37. | ZA 0228 | 6,364.44 |
| 38. | PF 4006 | 38,322.50 |

04.02 සභාව සතු වාහන සඳහා අවශ්‍ය ටයර්, ටියුබ් හා කොලර් ලබා ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් විවෘත කිරීම.

සභාව සතු වාහන සඳහා අවශ්‍ය ටයර් ලබා ගැනීමට කැඳවන ලද මිල ගණන් අනුව ආයතන දෙකකින් මිල ගණන් ලැබී තිබුණි. එම මිල ගණන්වලට අනුව අදාල ආයතනවලින් පහත සඳහන් පරිදි අවම මිල ගණන් යටතේ මිලදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. (CEAT වර්ගයේ Sri Lankan ටයර් වර්ගය)

| ආයතනය | ටයර් වර්ගය | එකක මිල රු. | ප්‍රමාණය |
|---|---|---|---|
| ජයන්ති ටයර් සෙන්ටර් | 750 x 16 | 17,600.00 | 10 |
| | 700 x 16 | 16,200.00 | 06 |
| | 700 x 15 | 15,200.00 | 04 |
| | 650 x 15 | 13,500.00 | 06 |
| | 825 x 16 | 27,850.00 | 06 |
| | 650 x 16 | 14,300.00 | 06 |
| | 13 x 28 | 79,000.00 | 02 |
| | 265 x 70 | 35,800.00 | 04 |
| PS ටයර් සෙන්ටර් | 600 x 16 | 12,500.00 | 04 |

බළන්ගොඩ නගර සභාව සතු වාහන සඳහා අවශ්‍ය ටියුබ් සහ කොලර් මිල දී ගැනීමට කැඳවන් ලද මිල ගණන් අනුව ආයතන දෙකකින් මිල ගණන් ලැබී තිබුණි. එම මිල ගණන්වලට අනුව අදාල ආයතනවලින් පහත සඳහන් පරිදි අවම මිල ගණන් යටතේ මිලදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

| ආයතනය | ටියුබ් සහ කොලර් වර්ගය | එකක මිල රු. | ප්‍රමාණය |
|---|---|---|---|
| PS ටයර් සෙන්ටර් | 750 x 16 (කොලර්) | 590.00 | 10 |
| | 825 x 16 (කොලර්) | 590.00 | 04 |

| | | | |
|---|---|---|---|
| ජයන්ති වයර් සෙන්ටර් | 700 x 15 (කොලර්) | 550.00 | 04 |
| | 750 x 16 (ටියුබ්) | 1,950.00 | 12 |
| | 825 x 16 (ටියුබ්) | 2,400.00 | 12 |
| | 700 x 16 (ටියුබ්) | 1,850.00 | 12 |

04.03 බැංකියවත්ත වහල අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් විවෘත කිරීම.

බැංකියවත්ත වහල අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව ආයතන හතරකින් මිළ ගණන් ඉදිරිපත් කර තිබූ අතර එහිදී අවම මිළ ගණන්, වගකීම් කාලය හා ප්‍රමිතිය පදනම් කර ගනිමින් පහත සඳහන් පරිදි මිළදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

| අනු අංකය | වර්ගය | අවශ්‍ය ප්‍රමාණය | ඒකක මිළ | තෝරා ගත් ආයතනය |
|---|---|---|---|---|
| 01 | අමානෝ සෙවිලි තහඩු 0.47/AZ 150 අඩි 20 | 50 | 5700.00 | පී.එම්.කේ.හාඩ්වෙයාර් |
| 02 | අමානෝ සෙවිලි තහඩු 0.47/AZ 150 අඩි 13 | 30 | 3675.00 | |
| 03 | අමානෝ සෙවිලි තහඩු 0.47/AZ 150 අඩි 06 | 16 | 1650.00 | |
| 04 | මුදුන් පීලි Rich cover 0.47 | අඩි 112 | 155.00 (අඩියක මිළ) | |
| 05 | වඩිම්බු ලෑලි 0.47 වැලන්ස් බෝඩ් | අඩි 178 | 155.00 (අඩියක මිළ) | |
| 06 | පීලි 0.47 | අඩි 178 | 145.00 (අඩියක මිළ) | |
| 07 | අගල් 1 1/2 ගණකම එල් අයන්මීටර් 06 දිග | බාර් 72 | 2500.00 | ෆයිරූස් හාඩ්වෙයාර් |
| 08 | තහඩු සවිකරන ඇණ (ස්කෲ) | කිලෝ 02 | ඇණයක මිළ රු.12.00 | |

| | | | | |
|---|---|---|---|---|
| 09 | G.I.Heavy duty 3mm/ 2" | 03 | 5200.00 | |
| 10 | welding Rods No 12 | පෙට්ටි 02 | 650.00 | |

05. කල් දී ඇති ප්‍රශ්න

05.01 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා

05.01.01 2020 අවුරුද්දේ වැසිකිළි ආධාරය ලබා දෙන්නේ කවදාද

මෙයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ 2020 වර්ෂයට අදාළ වැසිකිළි ආධාර අද දින ලබා දුන් බවයි.

05.01.02 ඉරිදා සතිපොලේ තොග මඩුව මාසික කුලී පදනම මත ලබාදිය හැකිද?

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, බලන්ගොඩ පිටස්තර වෙළෙන්ඳන් සිටින අතර බලන්ගොඩ නගරයෙන් ආදායම් ලබන්නේ පිටස්තර පුද්ගලයින් බවද පැවසීය. එමෙන්ම තමාගේ හිතවතෙකු ඉඩ කඩ තිබෙන කඩ කාමරයක් ඉල්ලා සිටින අතර නගර සභාවෙන් පවසන ඕනෑම කොන්දේසියකට යටත් වීමට ඔහු කැමැත්තෙන් සිටින බව ද එම ස්ථානයේ සිල්ලර බඩු අලෙවි කිරීමට කටයුතු කරන බව ද පවසන ලදී. මේ සම්බන්ධව වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, සභාව තීරණය කිරීමෙන් පසුව මෙම තොග මඩුව සාධාරණ කුලියකට ලබා ගැනීමට කැමැත්තෙන් සිටින බව ද නැවත සභාව ඉල්ලා සිටින ඕනෑම දිනක මෙම කඩ කාමරය ආපසු ලබා දෙන බව ද සභාවේ කැමැත්තක් තිබේනම් එම කැමැත්ත ලබා දීමට කටයුතු කරන ලෙස ද පැවසීය. එමෙන්ම බලන්ගොඩ මැතිවරණ කොට්ඨාසයේ ඇති සියලුම මහජන පොළ වෙළඳාම් කටයුතු එකම දිනක පැවැත්වෙන අතර මේ නිසා බලන්ගොඩ මහජන පොළට පැමිණෙන වෙළෙන්ඳන් 50% ක ප්‍රමාණයක් අඩුවන බව ද වැඩිදුරටත් සඳහන් කරන ලදී.

මේ පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ග්‍රාමීය ප්‍රදේශවල ගොවියන් තමන් වගාකරන නිෂ්පාදන මහජන පොළේ මෙම ස්ථානය වෙත ගෙනවිත් අලෙවි කරමින් මුදලක් උපයා ගන්නා බවයි.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් තොග මඩුව සම්බන්ධයෙන් වූ ඉල්ලීමට තම විරුද්ධත්වය පළ කරන බව ද මෙම ස්ථානය මඟින් මිනිසුන් 25 ක් 30 ක් ජීවත් වන අතර එක් පුද්ගලයෙකුගේ ඉල්ලීමක් නිසා කිහිපදෙනෙකුට අසාධාරණයක් සිදුවන බව ද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා සතියකට එක් දිනක් පමණක් මෙම තොග මඩුවෙන් ආදායමක් ලැබෙන බවත් මෙසේ ලබා දුනහොත් මාසය පුරාම ආදායමක් ලැබිය හැකි නමුත් මෙමඟින් මෙතුළ තම නිෂ්පාදන අලෙවි කරන ගොවීන්ගේ ජීවන වෘත්තිය අහිමි වන බවත් පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාවාරයකදී මහජන පොළ ටෙන්ඩර් කිරීම සභාවට ඉදිරිපත් කිරීමේදී ඇතැම් සභිකයින් එයට විරුද්ධ වූ බව ද මෙසේ තොග මඩුව ලබා දෙන්නේ නම් මෙයට වඩා මහජන පොළ ටෙන්ඩර් කිරීම සුදුසු බව ද පවසන ලදී.

06. කල් දී ඇති යෝජනා

06.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා

06.01.01 පෞද්ගලික ආයතන හා ලාභ ලබන ආයතන සඳහා රු1,500.00 වැනි මුදලක් ලබා ගෙන විෂබීජහරණය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.02 2021 වර්ෂය සඳහා සභාව සතු පහත සඳහන් කඩ කාමර ගිවිසුම් කෙටුම්පත් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- බස්නැවතුම්පළ තක්සේරු නොවූ කඩ කාමර
- බස්නැවතුම්පළ කාර්යාල වශයෙන් පවතින කඩ කාමර
- බස්නැවතුම්පළ පෙර ගෙවුම් ක්‍රමය (කීමනි) යටතේ ලබාදුන් කඩ කාමර
- බස්නැවතුම්පළ නව පදික කඩ කාමර
- බස්නැවතුම්පල යාබද ඉඩම් කොටස (පදික කඩ කාමර)
- සාප්පු කඩ
- මැණික් කඩ
- කාර් පාර්ක් කඩ කාමර
- පොදු වෙළෙඳසැල එළවළු හා සිල්ලර කඩ කාමර
- පොළ ගබඩා
- මහජන පොළ කඩ කාමර
- සම්පත් පියස යාබද ගොඩනැගිල්ල

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා මැණික් කඩ කාමර අවුරුදු දහයෙන් දහය ටෙන්ඩර් කළ යුතු බව ද මෙම කඩ කාමර අදාළ බදුකරු විසින් වෙනත් පුද්ගලයෙකුට පැවරිය නොහැකි බවද පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මේ සඳහා වාර්තාවක් සකස් කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.03 බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවයේ නියුතු සේවකයින් 17 දෙනා සඳහා රු.5,000.00 ක් වටිනා පෝෂණ මල්ලක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.04 පුස්තකාලය සතු ෆොටෝ කොපි යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා මෙට්‍රොපොලිටන් ආයතනය ඉදිරිපත් කර ඇති රු.41,177.81 ක මිළ ගණන අනුමත කර ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ටී.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.05 ගරු නාගරික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පහත සඳහන් මන්ත්‍රීවරුන් සඳහා නිල්කමල් පුටු 340ක් ලබාගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ එස්.එන්.ඒ.එන්ටප්‍රයිසස් ආයතනයේ රු.850.00 (එකක මිළ) මිළ ගණන අනුමත කිරීම.

- ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
- ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා
- ගරු උප සභාපති එම්.ටී.එම්.රූමී මැතිතුමා

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.06 ක්‍රීඩාපිටිය සඳහා 100w ප්ලැසර් 03 ක් මිළදී ගැනීම සඳහා ඔරේන්ජ් ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු.29,454.00 ක මිල ගණන අනුමත කර ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.07 මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හා පවුල් සෞඛ්‍ය සේවා නිළධාරීන් 14 දෙනෙකු සඳහා වාර්ෂික ලිපි ද්‍රව්‍ය බෙදා දීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ජෝති ස්ටෝර්ස් ආයතනයේ මිළ ගණන පහත සඳහන් පරිදි අනුමත කර ගැනීම.

| වර්ගය | මිළ | ප්‍රමාණය |
|---|---|---|
| A4 | 725.00 | බන්.28 |
| නිල් පෑන් | 17.50 | 350 |
| රතු පෑන් | 17.50 | 70 |
| ෆයිල් කවර | 5.00 | 350 |
| ස්ටෙප්ලර් | 345.00 | 14 |
| ස්ටෙප්ලර්කටු පැකට් | 30.00 | 14 |
| බයින්ඩින් ගම් | 290.00 | 14 |
| සාමාන්‍ය ගම් | 80.00 | 14 |
| වයිට් බෝඩ් පෑන් | 100.00 | 42 |
| පිටු 200 CR පොත් | 220.00 | 84 |
| පැන්සල් | 20.00 | 28 |
| පාට පැන්සල් | 230.00 | 14 |
| ප්ලැටිග්නම් | 135.00 | 14 |
| බොක්ස් ෆයිල් | 216/180 | 42 |
| කවර | 8.00/ 50.00 | 14 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.08 ගරු නාගරික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලාල් ගලප්පත්ති මැතිතුමාගේ ප්‍රතිපාදනයෙන් සිමෙන්ති මිටි 100 ක් බෙදාදීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන්

ඉදිරිපත් කර ඇති ජගත් හාඩ්වෙයාර් ආයතනයේ රු.930.00 (එකක මිළ) මිළ ගණන අනුමත කර ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.09 නගර සභා ක්‍රීඩාංගනයේ පාපන්දු ගෝල ආවරණ දෙක සඳහා අවශ්‍ය දැල් දෙකක් මිළදී ගැනීම සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ජෝති ස්ටෝර්ස් ආයතනයේ රු.4,850.00 (එකක මිළ) මිළ ගණන අනුමත කර ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.10 බැංකියවත්ත කාර්යාලය පිහිටුවීම හේතුවෙන් හා කර්මාන්ත අංශයට අවශ්‍ය ලී බඩු උපකරණ මිළදී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ සෙනෙවිරත්න ට්‍රේඩ් සෙන්ටර් ආයතනයේ මිළ ගණන් පහත සඳහන් පරිදි අනුමත කර ගැනීම.

| වර්ගය | ප්‍රමාණය | මිළ |
|---|---|---|
| කාර්යාලීය මේස (මධ්‍යම ප්‍රමාණය) | 04 | 9,350.00 |
| පොත් රාක්ක කුඩා | 01 | 5,500.00 |
| විදුලි පංකා | 01 | 4,000.00 |
| කුඩා අල්මාරි | 01 | 7,500.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.11 කඩ කාමර සඳහා ජල මීටර් සවිකිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව පී.එම්.කේ.හාඩ්වෙයාර් ආයතනයේ රු.2,275.00 ක මිළ ගණන් අනුමත කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.12 කුරු උයන දැල් ආවරණය සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව පී.එම්.කේ.හාඩ්වෙයාර් ආයතනයේ මිළ ගණන පහත සඳහන් පරිදි අනුමත කර ගැනීම.

| වර්ගය | ප්‍රමාණය | ඒකක මිළ |
|---|---|---|
| 2" Heavy GI Pipe | 07 | 5350.00 |
| 1" Heavy GI Pipe | 27 | 2475.00 |
| 6' Wide mesh (G.I. Pvc Coted – 300m | | 13600.00 |
| PVC Coted fence wire 200kg | 20kg | 8500.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.13 ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ලේඛන හා පත්‍රිකා සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන පහත සඳහන් පරිදි අනුමත කර ගැනීම.

| වර්ගය | මිළ | ආයතනය |
|---|---|---|
| කම්කරු චෙක්රෝල් | 4.00 | කරුණාරත්න ප්‍රින්ටර්ස් /සීගිරි ප්‍රින්ටර්ස් |
| ඉන්ධන ඕඩර් | 345.00 | කරුණාරත්න ප්‍රින්ටර්ස් |
| ප්‍රසම්පාදන පොත් | 300.00 | කරුණාරත්න ප්‍රින්ටර්ස් |
| ඉන්ධන නිකුත් කිරීමේ ලේඛන | 550.00 | කරුණාරත්න ප්‍රින්ටර්ස් |
| ධාවන සටහන් පොත් | 764.00 | සීගිරි ප්‍රින්ටර්ස් |
| වැය ලේඛන | 830.00 | සීගිරි ප්‍රින්ටර්ස් |
| පැමිණීමේ ලේඛන | 750.00 | කරුණාරත්න ප්‍රින්ටර්ස් |
| තොග පොත් | 830.00 | සීගිරි ප්‍රින්ටර්ස් |
| බලපත්‍ර ලේඛන | 1,200.00 | සීගිරි ප්‍රින්ටර්ස් |
| වරිපනම් බදු හා බදු කුලී ලේඛන | 1,200.00 | සීගිරි ප්‍රින්ටර්ස් |
| සභා වාර්තා අලවන පොත් | 1,200.00 | සීගිරි ප්‍රින්ටර්ස් |
| නිකුත් කිරීමේ නියෝකග ලේඛන | 750.00 | කරුණාරත්න ප්‍රින්ටර්ස් |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.14 2019 වර්ෂයේ විගණන ගාස්තු ලෙස රු.455,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.15 සුහුරු පුස්තකාලය (Smart Library) සඳහා වායු සමීකරණ යන්ත්‍රයක් හා 18w පැනල් ලයිට් 04ක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.16 ගලි ප්‍රතිකාරක පද්ධතිය සඳහා කොහු මෙට්ට 02 ක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.17 ආපදා ණය ලබා ගැනීම. - දිල්කි තාරකා ජයවික්‍රම මිය. - රු.250,000.00

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.18 සුදර්ශනපුර ප්‍රජා ශාලාව පෙර පාසලක් ලෙස පවත්වාගෙන යාම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.19 දහයියා පිළිස්සීම සඳහා දාහකයක් සකස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.20 2021 වර්ෂය සඳහා අයවැය ලේඛන 50ක් මුද්‍රණය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.21 ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ජෝති ස්ටෝර්ස් ආයතනයේ මිළ ගණන් පහත සඳහන් පරිදි අනුමත කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

| වර්ගය | ඒකක මිළ | ප්‍රමාණය |
|---|---|---|
| ඉදල් | 180.00 | 200 |
| ස්ටේප්ලර් මැෂින් | 345.00 | 10 |
| සර්වියට් | 55.00 | 20 |
| පේපර් ක්ලිප් පැකට් | 50.00 | 35 |
| Air Freshner | 350.00 | 10 |
| ෆයිනෝල් ලී.4 | 850.00 | 10 |
| සෙලෝටේප් ලොකු | 50.00 | 30 |
| සෙලෝටේප් පොඩි | 30.00 | 30 |
| ඩබල් ටේප් | 90.00 | 10 |
| ලොකු ලියුම් කවර | 2.77 | 500 |
| බ්‍රවුන් පේපර් | 12.50 | 100 |
| පොලිතීන් | 440.00 | 5 Kg |

| | | |
|---|---|---|
| ග්ලාස් ක්ලීනර් | 230.00 | 24 |
| ලොකු ස්ටෙප්ලර් මැෂින් | 4200.00 | 01 |
| ලොකු බොක්ස් හෝල්ඩර් | 325.00 | 75 |
| පොඩි බොක්ස් හෝල්ඩර් | 180.00/210.00 | 100 |
| පාට ගම්ටේප් | 170.00 | 100 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.22 ගබඩා අවශ්‍යතා සඳහා පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| බලපත්‍ර ගාස්තු පොත් | 05 |
| ඕඩර් පොත් | 50 |
| ඉදල් | 300 |
| OE කෑන් | 20 |
| අඩි රූල් | 10 |
| CR V පොත් | 20 |
| CR I පොත් | 20 |
| CR II පොත් | 20 |
| Field Note Book | 30 |
| Air Freshner | 15 |
| Glass Cleaner | 20 |
| වෙනත් ආදායම් ලේඛන | 10 |
| කලු කවර (කසළ) | 300 |
| විපෙක්ස් | 20 |
| ස්ටෙප්ලර් කටු | පෙට්ටි 25 |
| AAA බැටරි | 25 |
| Sanitizer 500ml | 20 |
| සෙලෝටේප් ලොකු | 50 |
| සෙලෝටේප් පොඩි | 50 |
| White Board Pen | 20 |
| ලියුම් කවර (පෞද්ගලික ලිපි ගොනු දමන) | 200 |

| | |
|---|---|
| ලයිෆ්බෝයි | 1000 |
| A4 | පෙට්ටි 75 |
| LQ 2090 Epson Ribbon | 05 |
| 12w LED Bulb | 30 |
| post ity pkt | 20 |
| ස්ටෙප්ලර් මැෂින් | 10 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.23 GK 6227 ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය බ්‍රේක් ලයිනර් සීල් හතරක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති තිළිණ මෝටර්ස් ආයතනයේ රු.18,000.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.24 LL 7688 ෆෝටෝන් රථයේ ඉදිරිපස අසුන හා පිටුපස අසුන අබලන් වී ඇති බැවින් එය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.25 සභාව සතු අත් කරත්ත අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ෆයිරූස් හාඩ්වෙයාර් ආයතනයෙන් ලැබී ඇති රු.34,370.00 මිළ ගණන අනුමත කර එම ආයතනයෙන් අදාළ ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | අවශ්‍ය ප්‍රමාණය | ඒකක මිළ |
|---|---|---|
| 16 Bug GI Sheet | 02 | 7500.00 |
| කැට්ලොපෙස් | 1Kg | 1360.00 |
| එනමල් තීන්ත කළු | 3 L | 3480.00 |
| එනමල් තීන්ත කොළ | 2 L | 2320.00 |
| 80 වැලි කොළ | 05 | 80.00 |
| 2'X2' කොටු දැල් BWG 10 Sheet | 01 | 4300.00 |
| 1'x1'5'mm ඇන්ගල් අයන් බාර් | 02 | 1550.00 |
| 12 වෙල්ඩින් කූරු | 2 kg | 280.00 |
| 1/4x1/2 පට්ටම් | 05 | 200.00 |
| තිනර් | 5 l | 250.00 |
| කටින් වීල් 4' | 20 | 80.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.26 බැංකියවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ස්ථාපිත කර ඇති කාර්යාලය සඳහා නව පරිගණක යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.27 RD 8000 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම හා ක්ලච් පද්ධතියේ පහත සඳහන් අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති හේෂාන් මෝටර්ස් ආයතනයේ මිළ ගණන් පහත සඳහන් පරිදි අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ඉටු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | මිළ |
|---|---|
| ප්‍රෙෂර් ප්ලේට් රිවට් ගලවා ප්‍රෙෂර් කර නැවත සවි කිරීමට | රු.8500.00 |
| ක්ලච් රේසරය ගලවා නැවත අලුත් රේසරයක් සවි කිරීම | රු.4500.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.28 "වාහන නවතා තැබීම තහනම්" (No Parking) දැන්වීම් පුවරු 20 ක් සකස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුෂ්ඩි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් (No Parking) දැන්වීම් පුවරු සවි කිරීමේදී සැලැස්මක් ඇතිව සවි කරන ලෙසත් දියුණු වන නගරයක පාළු ස්වභාවයක් ගැනීම සුදුසු නොවන බවද පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රථ වාහන කමිටුවක් පවත්වා එහිදී අවශ්‍ය තීන්දු තීරණ ගන්නා බවත් ඒ සඳහා සියලු මන්ත්‍රීවරුන් සහභාගි කර ගන්නා බවත් පවසන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.29 සභාව සතු දේපල වලට අයත් පොදු වෙළෙඳසැල බටහිර පැත්තේ ඉඩම (පළතුරු කඩ කාමරය) 2011 වර්ෂයෙන් පසුව ගිවිසුම් ගත වී නොමැති අතර ඒ සඳහා 2020.10.01 වන විට රු.25,500.00 ක මුදලක් හිඟ මුදලක්ව පවතී. එම හිඟ මුදල ගෙවා මෙම කඩ කාමරය සඳහා ගිවිසුම් ගත වීමට දැනට මෙම කඩ කාමරය භුක්ති විඳින පී.ඒ.සී.ප්‍රියන්ත මහතා අවසර ඉල්ලා ඇත. ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.30 කසළ ට්‍රැක්ටර් රථ සඳහා අවශ්‍ය හෝන් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ශක්ති එන්ටර්ප්‍රයිසස් ආයතනයේ රු.22,000.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.31 2020 නොවැම්බර් මස කර්මාන්ත අංශය මඟින් සිදුකිරීමට අපේක්ෂිත නඩත්තු සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

01. කානායම්වත්ත මාර්ගය නඩත්තු කිරීම.

02. සඳුන්ගම පාර නඩත්තු කිරීම.

03. සුබයිර් අලීම් මාවත නඩත්තු කිරීම.

04 ඕළුගංතොට කරදියමුල්ල ගමගෙදර පාර නඩත්තු කිරීම

05. කිරිදිගල වැලිහරනාව පොල්ගහගොඩ පාර නඩත්තු කිරීම

මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| වැලි කියුබ් | 15 |
| 6 X 9 ගල් කියුබ් | 15 |
| 1 1/2 ගල් කියුබ් | 15 |
| සිමෙන්ති | 50 |

මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය

දිනකට සේවකයන් 15 බැගින් දින 25 කට කම්කරුවන් 375ක් අවශ්‍ය වේ.

මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය රථවාහන

| | |
|---|---|
| ටිපර් රථය | දින 25 |
| ට්‍රැක්ටර් රථය | දින 25 |
| D/D රෝලය | දින 15 |
| JCB යන්ත්‍රය | පැය 50 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ටී.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.32 සභාව විසින් බදු කුලී ප්‍රමාද ගාස්තු අය කිරීමේදී විවිධ ආකාරයෙන් ප්‍රමාද ගාස්තු අය කරන බැවින් ඒ සඳහා අය කරනු ලබන ප්‍රමාද ගාස්තු එකම ප්‍රතිශතයක් යටතේ අය කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින්, 2021 වර්ෂයේ සිට සභාව විසින් අය කරන බදු කුලී සෑම මසකම 10 වන දින අය කිරීමටත්, එතැන් සිට ප්‍රමාද වන සෑම එක් දිනක් සඳහාම අදාල කුලියෙන් 10%ක මුදලක් ප්‍රමාද ගාස්තු ලෙස අය කිරීමටත් සුදුසු බව යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.33 කාර්යාලීය නිළධාරීන් හා සේවකයින් සඳහා සේවා හැඳුනුම්පත් සකස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.34 පොලිතීන් පුරවන ලද ප්ලාස්ටික් බෝතල් (Ecobricks) රු.5.00 කට මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.35 නව බස්නැවතුම්පළ ඩී 11/01 කඩ කාමරයේ විදුලි ඒකකයක් සඳහා අය කළ යුතු මුදල හා සේවා ගාස්තුව පිළිබඳ සභා තීරණයක් ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.36 කාර්යාලයේ තීන්ත ආලේප කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.37 කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නගර සභා තානායම් කුලිය, පෞද්ගලික බස්ගාල් ගාස්තු අයකිරීම, පොදු වැසිකිළි ගාස්තු අය කිරීම සම්බන්ධව සභා තීරණයක් ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පසුගිය සභාවේදී නගර සභා තානායම් කුලිය අය කිරීම සම්බන්ධව ගියවර සභාවේදී සංදේශ පැමිණිලි යටතේ මෙය ඉදිරිපත් වී, යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ නමුත් න්‍යාය පත්‍රයේ කල් දී ඇති යෝජනාවක් ලෙස ඉදිරිපත් කර යෝජනා ස්ථිර නොවීම නිසා මෙය වලංගු නොවන බැවින් අද දින න්‍යාය පත්‍රයට ඇතුලත් කළ බව ද ඒ අනුව අද දින සුදුසු පරිදි තීන්දුවක් ගත හැකි බව ද පවසන ලදී.

එමෙන්ම කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් බස් රථවලින් 40% ක් පමණක් ධාවනය වන බැවින් අය කරන ගාස්තුව සඳහා සහනයක් ලබා දෙන ලෙස පෞද්ගලික බස් ගාල් ගාස්තු ටෙන්ඩරය ලබා ගත් උදය ශාන්ත මහතා විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

තවද කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් මහජනයාගේ පැමිණීම ඉතා අඩුවීම හේතුවෙන් ආදායම පහළ බැසීම නිසා පොදු වැසිකිළි අය කිරීමේ කුලිය සම්බන්ධව සහනයක් ලබා දෙන එම ටෙන්ඩර්කරු විසින් ඉල්ලීමක් සිදු කර ඇති බවද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා තානායමේ ආදායම සම්පූර්ණයෙන්ම පහිම් වී නොමැති අතර එය තහවුරු කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන් සතුව තානායම් බිල්පත් පවා තිබෙන බව ද නගර සභාවේ අභ්‍යන්තර විගණන නිළධාරී මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කිරීම වෙනුවෙන් තානායම වෙත ගිය බවද එම අවස්ථාවේදී වෙළෙඳාම ක්‍රියාත්මක මට්ටමේ පවතින බවට එතුමා විසින් වාර්තාවක් ලබා දී ඇති බව ද පවසන ලදී. එම වාර්තාවට අනුව ඔක්තෝම්බර් මස 1 දින සිට 21 දක්වා රට බීම හලේ විවිධ බීම වර්ග මිලි ලීටර් 355,010 ක් අලෙවි වී ඇති අතර ඔක්තෝම්බර් 26 දින ලේඛන පරීක්ෂා කළ අවස්ථාවේ දී සේවය ලබා ගැනීම සඳහා පුද්ගලයින් තිදෙනෙකු පැමිණි බව ද විවාහ මංගලෝත්සවයක් පවතින බවට දක්වා තිබූ බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින්, තානායම තුළ ආහාර අලෙවිය සිදු නොවන අතර එක් කෝකියෙකු හා ගෝලයෙකු සිටින බවත් ජල විදුලි බිල්පත් පියවීමට මෙන්ම සභාවට කුලිය ගෙවන විට ලක්ෂ හතක පමණ වියදමක් යන බවත් මිලිලීටර් 355,010 ක් වුවද බෝතල් වශයෙන් ගත් කළ එය ඉතා කුඩා ප්‍රමාණයක් පමණක් බවත් ය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාව වෙත තානායම් ටෙන්ඩර්කරු ඉදිරිපත් කළ ලිපියේ සඳහන් පරිදි සෞඛ්‍ය උපදෙස් මත

රටබීම හල වසා තැබීම, උත්සවශාලා පවත්වාගෙන යාම හා නවාතැන් ලබා දීම සඳහා අවසර ලබා දී නොමැති බව සඳහන්ව ඇතත් රට බීම හල විවෘතව පවත්වා ගෙන ගොස් ඇති අතර විවාහ උත්සවයක් පවත්වා ඇති බවද මෙය යම් තරමක් ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන ගොස් ඇති බවද සභාවට අයවිය යුතු ආදායමක් මෙසේ කපා හැරීම ගැටලුවක් වන බවද එබැවින් සම්පූර්ණ මුදල අඩු කිරීම නොව යම් සහනයක් ලබාදීම සුදුසු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් කොවිඩ් 19 වසංගතය පැතිරයාමත් සමඟ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු සෞඛ්‍ය උපදෙස් පරිදි කටයුතු කිරීමට උපදෙස් දී ඇති නමුත් ලිඛිතව දැනුවත් කර නොමැති බව පවසන ලදී.

මෙහිදී සභාවේ සිදුකරන ලද දීර්ඝ සාකච්ඡාවෙන් අනතුරුව රට තුළ පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඉහත සඳහන් සභා දේපල වල ආදායම අඩුවීම හේතුවෙන් සභාව විසින් අයකර ගන්නා මාසික කුළිය 2020 ඔක්තෝම්බර් මස සඳහා 50% ක් අය කර ගැනීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.38 සභාව සතු පොදු වෙළෙඳසැල පිටුපස අංක 35/23 කඩ කාමරය එරංග සඳරුවන් වෙත්තසිංහ නමින් අපගේ ලේඛනයේ ඇතත් භෞතිකව නොමැත. මෙම කඩ කාමරය සඳහා 2019.12.31 දින වන විට රු.4,800.00 ක මුදලක් ඇත. මෙම මුදල කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.39 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

- රාජ්‍ය පරිපාලන ලේකම්තුමාගේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 1/2020 පරිදි කොවිඩ් 19 වෛරසය ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ආයතන විවෘත කර කාර්යාල කටයුතු පවත්වාගෙන යාම සඳහා නිළධාරීන් හා සේවකයින්ට අවශ්‍ය සැනිටයිසර් 100ml 210ක් හා 500ml 11 ක් මිළදී ගැනීම Super Care Distributors ආයතනය වෙත රු.28,975.00 ක මුදලක් ගෙවීම.

- කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය සිමෙන්ති මිටි 34 ක් මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් ආයතනය වෙත රු.33,850.00 ක මුදලක් ගෙවීම.
- කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය යතුරු සෙට් හා බොක්ස් යතුරු සෙට් දෙකක් මිළදී ගැනීම වෙනුවෙන් සරණි පික්චර් පැලස් ආයතනය වෙත රු.20,150.00 ක මුදලක් ගෙවීම.
- පුස්තකාල පොත් සංරක්ෂණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් ජෝති ස්ටෝර්ස් වෙත රු.28500.00 ක මුදලක් ගෙවීම
- කාර්යාලීය කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු සංරක්ෂණය කිරීම සඳහා ලෙදර්ෂීට් මිළදී ගැනීම සඳහා ජෝති ස්ටෝර්ස් වෙත රු.18,315.00ක මුදලක් ගෙවීම.
- මාළු කඩ සඳහා ජල සම්බන්ධතාවය ලබා දීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් වෙත රු.14,757.00 ක මුදලක් ගෙවීම.
- ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ මිළදී ගනු ලැබූ වළං කට්ටලයක් සඳහා ජෙස්මින් ඇලුමිනියම් වෙතින් ලැබී ඇති රු.53,500.00 ක මුදල ගෙවීම.
- ගරු නාගරික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සුනේත්‍රා වීරසිංහ මැතිතුමියගේ ප්‍රතිපාදන යටතේ බුෆේ සෙට් එකක් මිළදී ගැනීම වෙනුවෙන් ජෙස්මින් ඇලුමිනියම් වෙත රු.40,500.00 ක මුදල් ගෙවීම.
- බස්නැවතුම්පල උඩු මහලේ පිවිසුම හා පුස්තකාල ස්මාට් ලයිබ්‍රරියේ තීන්ත ආලේප කිරීම සඳහා තීන්ත මිළදී ගැනීම වෙනුවෙන් හර්ෂණ කලර් සෙන්ටර් වෙත රු.36,941.00 ක මුදලක් ගෙවීම.
- 226-7521 ටිපර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.මෝටෝ සර්විස් ආයතනය වෙත රු.18,150.00 ක මුදලක් ගෙවීම.
- HF -7899 JCB යන්ත්‍රය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.මෝටෝ සර්විස් ආයතනය වෙත රු.17,975.00 ක මුදලක් ගෙවීම.
- ඇඟිලි සළකුණු යන්ත්‍රයේ වාර්ෂික නඩත්තු ගාස්තු ලෙස රු.12,500.00 ක මුදලක් Ekrain Holdings ආයතනය වෙත ගෙවීම.
- මහධිකරණ නඩු අංක WA 25/2019 දරණ නඩුව වෙනුවෙන් පෙනී සිටීම වෙනුවෙන් නීතිඥ ගාස්තු ලෙස රු.10,000.00 මුදලක් හා ලිඛිත දේශන සැකසීම සඳහා රු.10,000.00 ක මුදලක් නීතිඥ තුෂාරි සූරියආරච්චි මහත්මිය වෙත ගෙවීම.
- තුරු උයන සඳහා පුවරු හා වාහන නවතා තැබීම තහනම් පුවරු 04ක් සකස් කිරීම වෙනුවෙන් ලයිෆ් ඇඩ් ආයතනය වෙත රු.12,800.00 ක මුදලක් ගෙවීම.
- ළමා උද්‍යානය සඳහා පුවරු 03ක් සකස් කිරීම වෙනුවෙන් ලයිෆ් ඇඩ් ආයතනය වෙත රු.9,000.00ක මුදලක් ගෙවීම.
- විවිධ කර්මාන්ත අවශ්‍යතා සඳහා 4" පුරවපු ගල් 400ක් මිළදී ගැනීම වෙනුවෙන් තිරණි සප්ලයර්ස් වෙත රු.17,600.00ක මුදලක් ගෙවීම.
- පුස්තකාල කාර්ය මණ්ඩල වැසිකිළිය සඳහා දොර හා උළුවහු සාදා සවි කිරීම වෙනුවෙන් නිර්මාණි ඇලුමිනියම් ආයතනය වෙත රු.12,500.00 මුදලක් ගෙවීම.

- කාර්යාලීය නිළධාරි මේස 17 ක් සඳහා විදුරු මිළදී ගැනීම වෙනුවෙන් නිර්මාණි ඇලුමිනියම් ආයතනය වෙත රු.28500.00 ක මුදලක් ගෙවීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.40 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වව්චර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2020-10-08 | ලංකා විදුලි බල මණ්ඩලය - 2020 සැප්තැම්බර් මස කාර්යාලය, නගර සභා යාබද ගොඩනැගිල්ල, ආයුර්වේදය, ප්‍රේක්ෂකාගාරය, පුස්තකාලය විදුලි බිල ගෙවීම. | 33 | 033623 | 39901.50 |
| | ලංකා බිදුලි බල මණ්ඩලය - 2020 සැප්තැම්බර් මස පොදු වෙළෙඳසැල,මහජන පොළ, මුරකුටිය (පොළ), වැසිකිළිය (පොළ), දොරවෙල ගබඩාව, ආපන ශාලාව (පොළ) | 35 | 033623 | 14359.80 |
| | Dialog Broadband Network Pvt Ltd – Dialog Telephone bill (Office), Dialog Internet Bill (Office), Dialog 4G බැංකියවත්ත/සම්පත් පියස | 36 | 033625 | 24918.14 |
| 2020-10-09 | B.K.J.S අමරදාස - ඉන්ධන බිල්පත් පියවීම (2020-07-23 සිට 2020-07-30 දක්වා | 42 | 033629 | 49829.21 |
| | 2020-09-01 දින සිට 220-09-30 දක්වා පොලිතින් තේරීම හා පොලිතීන් කැපීම වෙනුවෙන් වැටුප් ගෙවීම | 43-3 | 033630 | 59800.00 |
| | 2020-09-01 දින සිට 2020-09-30 දක්වා කාණු දැමීම, කසළ ඉවත් කිරීම, කම්කරු හා රියදුරු වැටුප් ගෙවීම | 43-6 | 033630 | 221000.00 |
| | 2020-09-01 දින සිට 2020-09-30 දක්වා පොහොර හැලීම හා කසළ තෙරීම සඳහා කම්කරු වැටුප් ගෙවීම | 43-7 | 033630 | 176800.00 |
| | 2020-09-01 දින සිට 2020-09-30 දක්වා කර්මාන්ත අංශයේ මේසන් හා කම්කරු වැටුප් ගෙවීම | 43-8 | 033630 | 575550.00 |
| | පැරකුම් කෘෂි සේවා මධ්‍යස්ථානය - සෞඛ්‍ය අංශයේ ඉසින යන්ත්‍ර අලුත්වැඩියාව සඳහා ස්ප්‍රේ ටැංකි ඇතුළට පොම්ප දෙකක් මිළදී ගැනීම | 49 | 033647 | 10500.00 |
| 2020-10-12 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් -2020 වර්ෂයේ තෙවන කාර්තුවට අදාළ මුද්දර ගාස්තු ගෙවීම | 54 | 033650 | 40053.00 |
| 2020-10-13 | සභාපති,බුලත්ගම එක්සත් මිතුරු සංසදය - උඩ ඇල්ලෙපොල සමගි අවමංගලයාධාර සමිති ගොඩනැගිල්ලේ බිම් මහලේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ගිවිසුම් ඇප තැම්පත් හා රැඳවුම් මුදල් ගෙවීම. | 57 | 033653 | 54000.00 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය -2020 සැප්තැම්බර් හා ඔක්තෝම්බර් මාසවල කාර්යාලය, පිංතාලිය ජල බිල්පත් ගෙවීම | 65 | 033658 | 13081.14 |

| | | | | |
|---|---|---|---|---|
| | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - 2020 සැප්තැම්බර් මස ජල බිල්පත් ගෙවීම | 67 | 033658 | 50976.01 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩල - 2020 සැප්තැම්බර් හා ඔක්තෝම්බර් මාස වල දොරවෙළ ගබඩාව, පොදු වෙළෙඳසැල, මහජන පොල ජල බිල්පත ගෙවීම | 68 | 033658 | 30905.60 |
| | ලංකා විදුලි බල මණ්ඩලය - 2020 සැප්තැම්බර් මස බස්නැවතුම්පල විදුලි බිල්පත ගෙවීම | 70 | 033660 | 35277.20 |
| 2020-10-15 | දුනුමඩලගහවත්ත ප්‍රදේශවාසීන්ගේ සුභ සාධක සංගමය - ජේ.විලියම් 'මාවතේ රණවක මහතාගේ නිවස අසලින් යන මාර්ගය සකස් කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැම්පත් ගෙවීම. | 84 | 033681 | 98400.00 |
| 2020-10-16 | Dialog Broadband Network Pvt Ltd – Dialog land line bill (Office 2020-09-11 - 2020-10-10, Dialog Cloud Bill (Office) 2020-09-11 - 2020-09-30 | 89 | 033686 | 19922.00 |
| 2020-10-19 | ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය - 2020-07-08 සිට 2020-09-20 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 93 | 033690 | 154627.71 |
| | ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය - 2020-09-01 සිට 2020-09-26 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 94 | 033690 | 160236.70 |
| | B.K.J.S අමරදාස -2020-09-01 සිට 2020-09-30 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 95 | 033691 | 204076.45 |
| 2020-10-20 | බී.කේ.ඩී.පී.ජිනදාස - 2020 සැප්තැම්බර් මස පුස්තකාලයට පුවත්පත් හා සඟරා සැපයීම. | 97 | 033693 | 12620.00 |
| | සරත්චන්ද්‍රහාඩ්වෙයාර් - විවිධ කර්මාන්ත අවශ්‍යතාවයන් සඳහා ද්‍රව්‍ය මිළදී ගැනීම | 98 | 033694 | 17580.0 |
| | ඩී.එම්.චන්ද්‍රසේකර - නීතිඥ ගාස්තු ගෙවීම | 111 | 033698 | 29000.00 |
| 2020-10-27 | ලංකා විදුලි බල මණ්ඩලය - 2020 ඔක්තෝම්බර් මස කාර්යාලය නගර සභාවට යාබද ගොඩනැගිල්ල ප්‍රේක්ෂකාගාරය නගර සභා පෙර පාසල විදුලි බිල්පත් ගෙවීම | 127 | 033706 | 37865.95 |
| | ලංකා විදුලි බල මණ්ඩලය - 2020 ඔක්තෝම්බර් මස පොදුවෙළෙඳසැල මහජන පොළ, මුරකුටිය, වැසිකිළිය (පොළ), දොරවෙල ගබඩාව, ආපන ශාලාව පොළ විදුලි බිල්පත ගෙවීම. | 128 | 033706 | 10618.00 |
| | සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම - පොදු වෙළෙඳසැල අංක 15,16,17 කඩ කාමර, පොළ ආපන ශාලාව, රථ වාහන නැවතුම් ගාස්තු, පෞද්ගලික බස්ගාල් ගාස්තු, සභාව සතු දැන්වීම පුවරු 10 ටෙන්ඩර් කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් තිනකරන් පුවත්පතේ පළ කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 132 | 033710 | 43875.00 |
| | ඉහත ටෙන්ඩරය දිනමිණ පුවත්පතේ පළ කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම | 133 | 033710 | 45900.00 |
| | කසළ ඉවත් කිරීම ටෙන්ඩර් දැන්වීම තිනකරන් හා දිනමිණ පුවත්පතේ පළ කිරීම . | 134 | 033711 | 38556.00 |
| | කුමාරගම ගැමුනු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය - උඩ ඇල්ලෙපොල මහමෙව්නා මාවතේ දෙවන අතුරු මාර්ගය තාර යොදා සංවර්ධනය කිරීම | 138 | 033743 | 127600.00 |
| | සුහද වැඩිහිටි සමිතිය - කරවිකැටිය මහමෙව්නා මාවතේ වම්පසට යොදා ඇති දෙවන අතුරු | 139 | 033744 | 297700.00 |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්ගය තාර යොදා සංවර්ධනය කිරීම | | | |
| ඉ | ශ්‍රම උදාන සුභසාධක සමිතිය - කිරිඳිගල ප්‍රජා ශාලාව අසළ නුගමුලහේන මාර්ගය සංවර්ධනය කිරීම 10%රැඳවුම් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැම්පත් මුදල් ගෙවීම | 140 | 033745 | 30450 |
| 2020-10-23 ග | පී.එම්.කේ.හාඩ්වෙයාර් - විවිධ කර්මාන්ත අවශ්‍යතා සඳහා ද්‍රව්‍ය මිළදී ගැනීම | 161 | 033758 | 19420.00 |

ත

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06.01.41 මෙම සභාවේ තාවකාලික සේවකයන් සඳහා සේවා ගිවිසුම් සකස් කිරීමට අනුමැතිය ලබාගැනීම

- ටී.ජී.පේමසිරි
- කේ.ජයකොඩි
- ටී.සුබ්‍රමනියම්
- බී.ආර්.කරුණාදාස
- එන්.බී.ගුණපාල
- කේ.එච්.නිමලදාස
- ඩබ්.බී.සිරිසේන
- කේ.එම්.සම්පත් විජය බණ්ඩාර
- යූ.එම්.උපාලි මුණසිංහ
- ආර්.ජයසුන්දර
- ඩී.ජේ.උපුල් ශාන්ත
- ජී.දයාරත්න
- ඩබ්.ජී.සමරදාස
- ආර්.ජී.ජයතිලක
- ඩබ්.ඩබ්.ෂෙල්ටන් පීරිස්
- ආර්.එම්.තුසිත ප්‍රසන්න
- සුජිත් මධුරංග
- කේ.ජී.තරිඳු ලක්මාල්
- එම්.රොෂාන් ප්‍රනාන්දු
- එම්.එස්.අරවින්ද ඉන්දුසිරි
- පී.කනගරාජා

- ජී.ඩී.සන්ධ්‍යානි
- එච්.එම්.අනුර ප්‍රේමසිරි
- ආර්.කේ.ඩී.නිලන්ති
- කේ.නාලක
- ආර්.ක්‍රිෂ්ණන්
- ලාල් ගුණරත්න
- එම්.වීරසිරි
- එම්.එම්.ඉරෝෂන් හේමන්ත
- වයි.ඩී.සුදත් සංජය
- ජී. එම්. අජිත් ප්‍රියශාන්ත

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.42 බැංකියවත්ත වැසිජල කාණු පද්ධතිය සකස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.43 ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය ටෝනර් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ PC Systems ආයතනයේ මිළ ගණන් පහත සඳහන් පරිදි අනුමත කර අදාළ ආයතනයෙන් එම ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

Epson LQ-2190 Ribbon – Rs.3,400.00

NPG – 28 Photocopy Toner – Rs.3,750.00

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.44 කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය පරිගණක යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති Wisdom Computer Technologies

ආයතනයේ රු.89,000.00 ක මිළ ගණන අනුමත කර අදාල ආයතනයෙන් පරිගණකය මිළදී ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.46 කොරෝනා මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සෞඛ්‍යාරක්ෂිත උපකරණ ලබා ගැනීම සඳහා රු.100,000.00 ක මුදලක් අනුමත කර ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුපේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පැවසුයේ 2020-11-09 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති කොරෝනා මර්දන කමිටුවේදී සාකච්ඡා වූ පරිදි කොරෝනා මර්දනය කිරීම සඳහා වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුව ඇති බව හා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිතුමා සඳහන් කල පරිදි මිනිසුන් එක්රැස්වන ස්ථාන වලදී ජනතාව දැනුවත් කිරීම සඳහා කණ්ඩායම් සකස් කර ඒ හරහා ජනතාව දැනුවත් කළ යුතු බවයි. එබැවින් එම වැඩසටහනට අවශ්‍ය සෞඛ්‍යාරක්ෂිත උපකරණ ලබා ගැනීමට රු.100,000.00 ක මුදලක් අවශ්‍ය වන බව වැඩිදුරටත් සඳහන් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 07. මන්ත්‍රී යෝජනා

**07:01 ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

07:01:01 බළන්ගොඩ වසමේ සංවර්ධන නිලධාරිනියට සේවා පියසෙ කොටසක් දීමට කටයුතු කරන්න.

07:01:02 මෙම දිනවල මාළු වෙළඳාම පොළ තුළ නොකෙරෙන නිසා එම ස්ථාන සංවර්ධනයට කිරීමට කටයුතු කරන්න.

07:01:03 මෙම ස්ථානයේ වැසිකිළිය ඉවත්කර දමන්න. සුදුසු ස්ථානයක් ගන්න.

07:01:04 පොදු වෙළඳපොළ නවීකරණය කරන්න.

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ බෝම්බුව ප්‍රජා ශාලාවෙන් කොටසක් බළන්ගොඩ වසමේ සංවර්ධන නිළධාරිතුමිය වෙත ලබා දීමට කටයුතු කරන ලෙසද මහජන පොළ තුළ මාලු වෙළෙඳාම සිදු නොකරන බැවින්

එම ස්ථානය සංවර්ධනය කරන ලෙසද පොදු වෙළෙඳපොළ නවීකරණය කරන ලෙසද පවසන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 08. කර්මාන්ත කමිටුව මඟින් නිර්දේශ කරන ලද යෝජනා

08.01 ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලික්ෂා මැතිතුමා

08.01.01 බළන්ගොඩ මිරිස්වත්ත සුබයිර් අලිම් මාවත සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති නිසා කඩිනමින් අළුත්වැඩියා කිරීම.

08.01.02.බළන්ගොඩ මිරිස්වත්ත සුබයිර් අලිම් මාවතේ සිට කහටපිටිය මාර්ගයට වතුර බැසීම සඳහා කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.එම්.ජුනයිදීන් මලික්ෂා මතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා අදහස් දක්වමින් මිරිස්වත්ත සුබයිර් අලිම් මාවතේ සිට කහටපිටිය මාර්ගයට වතුර බැසීම සඳහා කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම කඩිනමින් සිදු කරන ලෙස පවසන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

08.02 ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය

08.02.01.මුගුණමලේ ගලපල්ලෙඅරාවට හැරෙන ස්ථානයේ සිට පහළට මාර්ගය සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.පේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

08.03 ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය

08.03.01.හුණුකුඹුර කොට්ඨාශයේ කෝපිවත්ත මාර්ගයේ රණවිනාවත්ත අතුරු මාර්ගයේ ආරම්භ වන ස්ථානයේ සිට මීටර් 20ක පමණ කොටසක් අබලන්ව ඇති බැවින් එය ප්‍රතිසංස්කරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

08.04 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

08.04.01.ග්‍රාමීය මාර්ග ලක්ෂයක් කාපට් කිරීමේ ජාතික වැඩසටහන යටතේ කාපට් කිරීමට යෝජිත කනගනායගම් විද්‍යාල මාවතේ ඇති මාර්ගය පුළුල් කිරීමට බාධාවක්ව ඇති විදුලි කණුව ඉවත් කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ඇස්තමේන්තුව අනුමත කිරීම. - රු.85,038.31

08.04.02.දීර්ඝ කාලයකින් නඩත්තු කටයුතු නොකිරීම හේතුවෙන් දැඩි ලෙස අබලන් වී ඇති සුනන්දාරාම මාවතේ පළමු පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

08.05 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා

08.05.01.බෝම්බුව නිල්වලා ක්‍රීඩා සමාජය සඳහා වොලිබෝල් 02ක් හා දැලක් ලබාදීම.

08.05.02.පරගහකුඹුර තිසර ප්‍රතිභා ක්‍රීඩා සමාජය සඳහා වොලිබෝල් 02ක් හා දැලක් ලබාදීම

08.05.03.පන්සල්වත්ත මාර්ගය සුද්ධ පවිත්‍ර කිරීම හා කාණු පද්ධතිය පිළිසකර කිරීම

08.05.04.පන්සල්වත්ත මාර්ගයෙහි නිමල් මහතාගේ නිවස අසලට වීථි ලාම්පුවක් සවිකර දීම.

08.05.05.හදිසි ගංවතුර හේතුවෙන් විනාශයට පත් වතුකාරගොඩ පැතිබැම්ම පිළියෙල කරදීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් 08.05.01 යෝජනාව හා 08.05.02 යෝජනාව තම පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සිදු කරන බවද ඉතිරි යෝජනා සියල්ල කඩිනමින් ඉටු කර දෙන ලෙසද 08.05.05 යෝජනාව හතරවෙනි අවස්ථාවටත් න්‍යාය පත්‍රය සඳහා යොමු කළ බවද පවසන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

08.06 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා

08.06.01.කුමාරගම දෙවන පටුමග (බෝගහහේනමුල ඉඩමට මායිම්ව ඇති) ඩබ්.ජේ.චන්ද්‍රදාස මහතාගේ ඉඩම අසල සිට සිරිපාල මහතාගේ ඉඩම දක්වා ඇති කොටස ජේ.සී.බී යන්ත්‍රය යොදාගනිමින් සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

08.07 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

08.07.01.ජේනක පෙදෙසේ භූමිය සුද්ධ කරන අවස්ථාවේ හඳුනාගත් එම මාර්ගයට අත්‍යාවශ්‍ය පැතිබැම්ම( රුවන් මහතාගේ නිවස අසල) අඩි 02ක් උසට අඩි 40ක් දිගට සාදා නිම කිරීම.

08.07.02.කරවිකැටිය වටරවුම් පාරේ සී.සී.දෙමළ විද්‍යාලය දක්වා කාණුව එක් පැත්තක් කොන්ක්‍රීට් තහඩු වලින් ආවරණය කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ඉහත සඳහන් යෝජනා දෙක කඩිනමින් ඉටු කරන ලෙසත්, විධායක ඉංජිනේරු කාර්යාලය අසළ කොන්ක්‍රීට් ස්ලැබ් දෙකක් යොදන ලෙසත් පවසන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

08.08 ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය

08.08.01.කරවිකැටිය පස්වෙනි පටුමඟ අවසානයේ කාණු පද්ධතිය වැසී ගොස් ඇති බැවින් එය නැවත සකස් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

08.09 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා

08.09.01.ඇල්ලෙඅරාව එක්සත් මාවතේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම.

08.09.02.බළන්ගොඩ කල්තොට පාර අලාබ්දීන් මාවත ඉදිරිපිට කාණු පද්ධතිය කොන්ක්‍රීට් කර පිළිසකර කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් ඇල්ලෙඅරාව එක්සත් මාවතේ ඉතිරි 100 m ක කොටස සංවර්ධනය කරන ලෙසත් 08.09.02 යෝජනාව ඉටු කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙසත් පවසන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

08.10 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා

08.10.01.තානායම් පිවිසුම් පාර සංවර්ධනය කිරීම.

08.10.02.තානායමට පිවිසෙන ස්ථානයේ අඹ ගස වටා තාප්පය සෑදීම.

08.10.03.මීයුරල් එක ආසන්නයේ ඇති බැම්මේ ඉතිරි කොටස සෑදීම

08.10.04.ඉරිදා සතිපොළේ වැසිකිළිය සංවර්ධනය කිරීම.

08.10.05.සතිපොළේ තොග මඩුව තුළ සිටින පරවියන් කපුටන් එළවීම.

ඉහත සඳහන් යෝජනා සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

08.11 ගරු නාගරික මන්ත්‍රී එම්.එම්.ආර්.එස්.කවිරත්න මැතිතුමා

08.11.01.ඕළගංතොට මඩේවත්ත එයාර්ටෙල් කුළුණ පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම.- මන්ත්‍රී යෝජනා මත සභා අරමුදලින්

08.11.02.ඕළගංතොට අබිසෙවණ හෝටලය අසලින් වලවේ ගඟේ නාන තොටුපලට යන පඩිපෙල කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම.

08.11.03.ඕළගංතොට පුරණගෙදර මාර්ගයේ මාලනී මහත්මියගේ නිවස ඉදිරිපිට තුන්මන්හංදියේ කාණු පද්ධතියට ස්ලැබ් කැල්ලක් දමා සංවර්ධනය කිරීම.

08.11.04.මස්සැන්න පාරේ බස් හෝල්ට් එක ඉදිරිපිට පාර කැඩී ඇති කොටසට තම පෞද්ගලික වියදමින් තාර දැමීමට සභාවේ රෝල අයකිරීමකින් තොරව ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.එම්.ආර්.එස්.කවිරත්න මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

08.11.01 යෝජනාව තම පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් ඉටු කරන බවද ඉතිරි යෝජනා සියල්ල හැකි ඉක්මනින් ඉටු කර දෙන ලෙසද පවසන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

08.12 ලිපි මඟින් ලැබෙන යෝජනා සාකච්ඡා කිරීම

08.12.01 වීරසුන්දරාරාම පන්සල පාර පොදු කාණු පද්ධතිය පිළිසකර කිරීම.

08.12.03 බළන්ගොඩ කොටුගොඩැල්ල පාර, කොටුව පෙදෙසෙහි අනතුරුදායක කාණුව (බෝක්කුව සමඟ ඇති) ප්‍රතිසංස්කරණය කිරීම.

09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 8,273,084.26 |
| වෙනත් ලැබීම් | 10,529,784.44 |
| මුලු ලැබීම් | 18,802,868.70 |
| පුනරාවර්තන වියදම් | 9,876,407.75 |
| වෙනත් වියදම් | 2,774,223.39 |
| මුලු වියදම් | 13,672,753.96 |

2020-10-01 දින සිට 2020-10-31 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 21,632.00 |
| 227-5020 | 39,569.10 |
| | 0.00 |
| RD - 8240 | 27,371.64 |
| HF 7899 | 66,795.04 |
| | 0.00 |
| | 10,810.00 |
| BC-0005 | 42,970.00 |
| GC 0001 | 4,240.00 |
| 226-7521 | 19,145.00 |
| RC 8183 | 22,360.00 |
| LL - 7688 | 10,400.00 |
| HF - 8558 | 10,920.00 |
| GK-6227 | 13,331.70 |
| JD-4684 | 2,740.00 |
| ZA 0028 | 5,200.00 |
| RB 4786 | 2,912.00 |
| ND-5124 | 33,696.00 |
| PF-4006 | 29,964.00 |
| RD 8000 | 20,800.00 |
| 37-7933 | 6,240.00 |
| LL-2110 | 29,031.00 |
| RC 1118 | 36,449.25 |
| OV/M 0017 | 23,340.00 |
| | |
| UQ - 1933 | 0.00 |
| CSM 009 | 685.00 |
| DDR 0008 | 520.00 |
| DPP0006 | 11,060.00 |
| OS0006 | 755.00 |
| ZA 5039 | 6,208.80 |
| YG-0758 | 2,055.00 |
| එකතුව | **501,200.53** |

10. ඇස්තමේන්තු අනුමත කිරීම.

10.01 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා

10.01.01 ඕලුගංතොට සියඹලාගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීම - රු 288,000.00

10.01.02 ඕලුගංතොට මෞඩ්වත්ත නොහොත් එයාර්වෙල් කුලුන මාර්ගය සංවර්ධනය කිරීම - රු 475,176.19

ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10.02 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

10.02.01 දේශබන්දු මැතිතුමාගේ නිවස අසලින් බලකොටුව පාරට යාවන කෙටි මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම - රු 61,000.00

10.02.02 සේනක පෙදෙස වාහන හැරවීමට ඇති ස්ථානය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම - රු.99,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10.03 ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා

10.03.01 වතුකාරගොඩ බේබි නෝනා මහත්මියගේ නිවස අසල අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම - රු 271,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10.04 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය

10.04.01 වතුකාරගොඩ වෙල කොටසේ ඇති පැති බැම්ම සංවර්ධනය කිරීම - රු 670,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10.05 ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා

10.05.01 තානායම් පිවිසුම අසල බිතු කැටයම් නිර්මාණය කිරීම - රු 191,900.00

ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 11. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

### ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින්, ගංවතුරට යට වුණ පොළ කඩ 20 හි වෙළෙඳුන් ආධාරයක් ලබාදෙනු ඇතැයි විශාල බලාපොරොත්තුවකින් සිටින බැවින් රු.10,000.00 ක ආධාරය ඔවුන්ට ලබා දිය හැකි දැයි විමසන ලදී. එමෙන්ම ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම්තුමා ඉඩමක් ලබාදෙන්නේ නම් සුනඛයින් ගාල් කරන බවට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා පොරොන්දුවක් වූ බව ද පෙට්ටිගල පාර ආරම්භ වන ස්ථානයේ පවතින වාහන තදබදය පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසද පොළ කඩ 20 ආසන්නයේ බල්බ් දෙකක් සවි කරන ලෙසද පවසන ලදී.

### ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා අදහස් දක්වමින් අද දින 2020 වර්ෂයට අදාළව වැසිකිළි ආධාර ලැබුණු අතර ඒ පිළිබඳව සතුටු වන බව ද ලබන වසරේදීත් වැසිකිළි ආධාර ලබා දීමට කටයුතු කරන ලෙසද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ග නාම පුවරු සකස් කර ඇති නමුත් ඇතැම් මාර්ගවල නම් ඒ තුළ ඇතුලත් වී නොමැති බව ද එම මාර්ගවල නම් යොදන ලෙසට ඉල්ලීමක් සිදු කරන ලෙස ද පවසන ලදී. එමෙන්ම ෆලීල් හාජියාර් මාවතේ සුසාන භූමිය අසළ වීථි පහන් දෙක අක්‍රිය තත්ත්වයේ පවතින බැවින් එය සකස් කරන ලෙසද කහටපිටිය පාරේ අක්‍රිය වී ඇති වීථි පහන් සකස් කරන ලෙසද පවසන ලදී. එමෙන්ම නිරෝධායනයට ලක්වන පවුල්වල අලවන දැන්වීම දමිළ භාෂාවෙන් ද ඇලවීමට කටයුතු කරන ලෙසත් සිංහල භාෂාවෙන් පමණක් සඳහන්ව ඇති දැන්වීම දමිළ හා මුස්ලිම් නිවාසවල ඇලවීම තුළින් ඔවුන්ට එය තේරුම් ගත නොහැකිව මහත් අපහසුතාවයකට ලක්වන බවත් වැඩිදුරටත් පවසන ලදී.

එමෙන්ම කොරෝනා රෝගයෙන් මිය යන මුස්ලිම් ජනතාව ආදාහනය කිරීම පිළිබඳ ලංකාවේ මුස්ලිම් ජනතාව බියෙන් ජීවත් වූ අතර මුස්ලිම් ආගමේ හැටියට කවර හෝ සත්ත්වයෙකු පිළිස්සීම තහනම් බව ද මේ පිළිබඳ මුස්ලිම් ජනතාව කණගාටුවෙන් සිටින අතර කොවිඩ් 19 රෝගයෙන් මිය යන රෝගීන් භූමදානය කිරීම සඳහා රජය විසින් අවසර ලබා දීම පිළිබඳ තමන් සතුටුවන බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා කුමන ආගමක වුවත් කෙනෙකු මිය ගිය පසු අවසන් ආගමික වතාවත් සිදු විය යුතු බව වැඩිදුරටත් සඳහන් කරන ලදී.

### ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්, එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමාගේ කතාව සනාථ වන කරුණු අද දින රූපවාහිනියේදී විකාශය වූ බවද කොරෝනා රෝගයෙන් මිය යන අයගේ අවසන් කටයුතු වියළි ප්‍රදේශවල සිදු කරන බව එහිදී ප්‍රකාශ වූ බවද, පැවසූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා මුස්ලිම් අයෙකු ගුවන්යානාවකින් ගමන් කරන අතරතුර මුහුදට වැටුනොත් භූමදානය කරන්නේ කොහොමද යන්න විමසීය. කෙසේ නමුත් කුමන ආගමක හෝ විශ්වාසය ගරු කර මෙවැනි තීන්දුවක් තම ආණ්ඩුව විසින් ගැනීම පිළිබඳ සතුටු

වන බවද සෑම මිනුස්සයෙකුම තම ජීවිතයේ අවසන් කටයුතු ආගමානුකූලව සිදු කිරීමට කැමති බවද මෙපමණ කාලයක් මෙරට ජීවත්වන සුළු ජාතීන්ට, විවිධ ආගම් වලට නිදහස ලබා දී තිබූ අතර තම ආණ්ඩුවෙන් ද එම නිදහස තහවුරු කිරීම පිළිබඳ තමන් සතුටු වන බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය -

ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් වර්ෂා කාලයේදී කෝපිවත්ත මාර්ගයේ හා ආනන්ද මෛත්‍රී මාවතේ එකතුවන වර්ෂා ජලය සමනල මුදලාලිගේ නිවසට ගලා එන බැවින් එම ස්ථානයේ කාණුව සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා

උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින්, කල්තොට, කුමාරගම මාර්ගයේ පාර දෙපස වැවෙන තණකොළ එම ගමේ ජනතාව සතුව තිබෙන තණකොළ කපන මැෂින් දෙකක් යොදා පිළිසකර කරන නමුත් මේ වන විට එම මැෂින් දෙක අක්‍රිය තත්ත්වයේ පවතින බැවින් ඒ සඳහා සභාවේ තණකොළ කපන මැෂිම ලබා දෙන ලෙස පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා

සියඹලාගස්වත්ත මාර්ගයේ බැම්ම කඩා ගෙන ගොස් ඇති අතර එම බැම්ම කඩා ගෙන ගියහොත් මාර්ගයටද හානි සිදු වන බැවින් සභා පරමුදලින් හෝ එම බැම්ම සකස් කර දෙන ලෙස පවසන ලදී.

12. අවසානය

අද දින සභාව ඉතාමත් හොඳින් පවත්වා ගෙන යාම පිළිබඳ සතුටු වන බව ද ඒ වෙනුවෙන් ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තූතිය පළ කරන අතර එය අගය කරන බවද පෙර සභාවල ගැටුම් සමඟ පවත්වාගෙන ගිය ද අප සභාව සැහැල්ලුවෙන් පවත්වාගෙන යමින් නගර සභා සීමාව තුළ ජීවත් වන ප්‍රජාවට අවශ්‍ය වන සේවාවන් ඉටු කරන බවද මන්ත්‍රීතුමන්ලා සභාව වෙත ලබා දුන් එහෙත් ක්‍රියාත්මක නොවූ යෝජනා පිළිබඳ විශ්ලේෂණයක් සිදු කරන බැවින් ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ලබා දෙන ලෙසද පවසන ලදී.

එමෙන්ම අද දින සභාව සාර්ථක කර ගැනීම සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලය හා මාධ්‍ය වේදීන් සඳහා ස්තූතිය පුද කරමින් ප.ව 2.45 ට පමණ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,

සභාපති,

බළන්ගොඩ නගර සභාව